

# විප්‍රවාසී කිවිඳියන් දෙදෙනෙක්




විප්‍රවාසී කිවිඳියන්ට වඩා කවියක් සිටින්නේ මේ රටේ පමණකැයි සිතමි. මා දන්නා තරමට ඔස්ට්‍රේලියාවේ කිවිඳියන් දෙදෙනෙක් හෝ තිදෙනෙක් ඇත. එංගලන්තයේ ද දෙදෙනෙකි. එංගලන්තවාසී කිවිඳියක වන ලිලානි සමරසිංහගේ .ගිනි වැදුණු මායිම. මා කියවූයේ වසර හත අටකට පෙරය. කාගෙන්දෝ ඉල්ලාගෙනය, ඒ කාගෙන්දැයි දැන් මතක නැත. මා ළඟ ඉතිරිව ඇත්තේ සටහන් කරගත් කවි දෙකක් පමණි. ලිලානි ශ්‍රී ලංකාවේ කෝලහල ගැන කවි කිහිපයක් ලියා තිබුණු බවට මතකය. ඇගේ එක් කවියක් පහතින් උපුටා දක්වමි. එය අවුරුදු කවිය නමින් වූවකි.

දින දසුනේ දින ගනින්නට නොවේ
බිත්ති පුරා දින දසුන් එල්ලුවේ
අතුරු නැතුව සිදුරු වහන්නයි
මිතුරු සිනා ඇති කොළයක් තැබුවේ

අවුරුද්දේ අරුතය මා නො දන්නෙමී
තව එක දවසක් ගියා පමණී
අම්මා නැති දා මුළුතැන්ගේ
කැවිලි හදන්නේ හදවතේ ගින්දරෙනී

එරබදු මල් පාට දිහා බලා
කොහා හඬන්නේ බියපත් විලාසෙනී
නුඹට වගේ මට අඬන්න බැරි හින්දා
වෙස් මුහුණක් දාගෙන සිනාසුණා පමණී..

මා ලියා ගෙන ඇති ලිලානිගේ අනෙක් කව දන්දීම. නමුන් වූවකි. එයින් ඉදිරිපත් වන්නේ අර්ථ වෙනස් වුවද ඊට වඩා ප්‍රබල දැනීම් යැයි කිව හැකිය. එය මෙසේය.

නුඹේ පෙම් සඳ සොරා ගන්නට
පාරමී මං නොපිරුවෙමී
නුඹේ කඳුලට හිනාවෙන්නට
කිසි දිනෙක මං නොපැතුවෙමී
නුඹේ දරුනට පියෙකු වන්නට
වෙනෙකකුට කිසි නොහැකිමෙන්
මගේ හිමි බව නුඹට දෙන්නෙමි
හදවතේ පිරි දරු පෙමින්.

ප්‍රේමය - විරහ වේදනා - දරු පෙම බඳු සියුම් මිනිස් හැඟීම් කවට නැගීමෙහි ලා කවීන්ට වඩා කිවිඳියන් සමත් වන හැටියක් මම දකිමි. ඉහත දැක්වූ නිදසුන් දෙකම එය සනාත කරතැයි සිතමි. මගේ අදහස තව

දුරටත් සනාථ කරන කිවිඳියක් පැරීසියේ වාසය කරයි. ඒ දීපිකා කොඩිකාරගේ ය. කැළණිය සරසවියේ උපාධිධාරිනියක වන දීපිකා ඇගේ වචනයෙන් කිවහොත් - .වසර දහයක් පුරා පැරීසියේ ගොඩනැගිලි අතර සිරවී බාහිර ලෝකයෙන් බොහෝ දුරස් වී. සිටියකි.

තමා කාව්‍ය නිර්මාණයට යොමු වූ ආකාරයත්, එයින් ලබන සිත් සහනයත්, දීපිකා ප්‍රකාශ කරන්නේ මෙසේය.

.මව් බිමෙන් බොහෝ දුරස් වී, සිතිවිලි හා සිතුම් පැතුම්වලින් පමණකි, ඒ හා බද්ධ වී දුරු කළා වූ මගේ සිතට ආ පාළුව තනිකම මා බෙදා හදා ගත්තේ වදන් පෙළක් රිද්මයකට ගොනු කිරීමෙනි,.

සිත් සහනයක් පමණක් නොව දිවියට නොබා මුහුණ දීමට කවියක් - අදිටනක් වන්නට ද ඇයට කවිය පිහිට වූ සැටි මෙසේ ඇය විසින් සඳහන් කරනු ලැබේ,

.ගැහැනියක ලෙස දැරිය නොහැකි යයි සිතන තරම් ඉතා කටුක අත්දැකීම් රැසකට මුහුණ දුන් කාලවකවානුවක මම මේ කවි ලියූවෙමි,
මුහුණ දිය නොහැකි කිසිවක් මේ ලොව නැතැයි දැන් මම සිතමි, ජීවිතයේ අනේකවිධ ගැටළුවලට හිත කෙලින් කර ගැනීමට මට සිත සැහැල්ලු කළේ මා ලියූ කවි පංතින් ය, මා වන් තවත් ගැහැන-යකට දිරි ලැබේවායි සිතමින් සියලු කවි .ආදරණීය රෝමියෝ. ලෙස එක් තැන් කෙරුවෙමි,.

ආදරණීය රෝමියෝ යන ඇගේ කවි පොතේ නමය, එහි .ඈත ඔබට. නම් වූ කව මෙසේය,
.හිරුය ඔබ මට
පොළව මම වෙමි
ඔබේ හිරු රැස් මා සිප ගනී,

එයින් සැනසෙමි
එළිය ලබනෙමි
කෙළවරක් එහි නොදනිමි

කොතෙක් දුර වුව
සෙනෙහෙ අඳුනමි
ඔබ වටා මම සරනෙමි

කොතෙක් හිතුනද
ළං නොවන්නෙමි
දැවී අළු වී යනු බැරී.

මීටත් වඩා සියුම් සංකීර්ණ අර්ථයක් රැගත් කවකි, ඇය .මෙරුව. යන හිසින් රචනා කොට ඇත්තේ, එය පහත දක්වමි,

සොඳුරුයි දැල්වෙන ප්‍රදීපය
එළියයි ඉන් මුළු පළාතම
අනේ අසිරිමත් රාත්‍රිය
නෙතින් විඳ පමණක් නොසෑහෙමි
පහස විඳුමට ලොබ බඳින්නෙමි
දැල්වෙන සිළුවට ළං වෙමි
පිලිස්සෙන බව නොම සිතන්නෙමි

මෙරුව,
ඔහොම නවතිනු
ගැටී මියැදෙනු පමණක්ම නොව
නුඹ ගැටී සිළුවද නිවී යයි එවිට
එළියද හමාරයි
නුඹේ රැඟුමද හමාරයි.

ඇගේ .පිපාසය. නමින් එන කවෙහි මෙම තේමාවම වඩා පුළුල් අරුතක් දනවන අයුරින් ඉදිරිපත් කරන බව කිව හැකිය, එහි මුල් පද හතර සහ අගටම එන පද මෙසේය,

.ජීවිතය කතරකි
පිපාසිත වුවත් ඇති
දිය කඩිති යයි රුවැති
මිරිඟුව ම හඹා යන

දුර ඇති විටෙක
ලදොත්,, සැපයකැයි සිතුවත්
ළං වූ විටෙක
සියලුදේ මිරිඟුවකි
මේ පාළු දිවි කතර
මුවන් වූ අපට.

එංගලන්තයේ වසන තවත් කිවිඳියක් ඇත, ලක්බිම පත්තරයට එංගලන්තවාසී සිංහලයන් ගැන තොරතුරු රැගත් ලිපි පෙළක් ලියූ දර්ශනා ශම්මි විජේතිලකගේ .මම ඔබ නොහඳුනමි. නැමැති කවි පොතක් මෑතක ශ්‍රී ලංකාවේදී එළි දක්වන ලද කියවන්නට ලැබුණද පොත සොයා ගත නොහැකි විය, ඇගේ ඉහත සඳහන් ලිපි පෙළ .එංගලන්තයේ සැබෑ ලෝකය. නමින් පොතක් වශයෙන් පළ කරන ලද බව පසුගිය දා එම පත්තරයේම සඳහන්ව තිබුණේය,




STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243

